සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අනාවරණ පරීක්ෂණය 2021

**6 ශ්‍රේණිය**

# බුද්ධ ධර්මය

**කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
| --- |

සැලකිය යුතුයි

- පළමු කොටසේ සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- දෙවන කොටසේ පළමු පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

---

## I - කොටස

- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 සිදුහත් බෝසතාණෝ ආසන්න පෙර භවයේ සිටියේ .........................

(1) තුසිත දෙව්ලොවයි. (2) දෙව්දහ නුවරයි.

(3) කිඹුල්වත් පුරයෙහි ය. (4) තුසිත බඹ ලොවයි.

02 ''අග්ගෝ හමස්මි ලෝකස්ස'' ...... මෙම පාඨයෙහි තේරුම

(1) මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි. (2) මම ලොවටම අග්‍ර වෙමි.

(3) මම ලොවට ජ්‍යේෂ්ඨ වෙමි. (4) නැවත මට උපතක් නැත.

03 ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ ........ යන ගාථාව

(1) බුදු ගුණ පාඨයයි. (2) සඟ ගුණ පාඨයයි.

(3) දහම් ගුණ පාඨයයි. (4) බෝධි වන්දනා පාඨයයි.

04 මෙත් වැඩීමේ ආනිසංස ගණන

(1) 7 කි. (2) 6 කි. (3) 5 කි. (4) 11 කි.

05 සුදුසු කල දායාද පවරා දීම යන යුතුකම ඉටු කරනු ලබන්නේ

(1) දෙමාපියන් විසිනි. (2) පැවිදි උතුමන් විසිනි.

(3) දරුවන් විසිනි. (4) ගුරුවරුන් විසිනි.

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන වගන්ති හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහනෙහි යොදන්න.**

06 ජාතික කොඩියෙහි අඩංගු සංකේතයකි බෝපත් හතර ( )

07 සිල්වත්වීමේ ආනිසංසයකි කීර්තිය පැතිරීම. ( )

08 අපේ මුල්ම පන්සල ථූපාරාමයයි. ( )

09 සම්මා වාචා යනු නිවැරදි කර්මාන්තයයි. ( )

10 චුල්ලරාහුලෝවාද සූත්‍රය දේශනා කළේ නන්ද හාමුදුරුවන්ට ය. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට A කොටසේ ප්‍රකාශ හා සම්බන්ධ වන B කොටසේ ප්‍රකාශය තෝරා ඉරකින් යා කරන්න.**

| | **A කොටස** | **B කොටස** |
|---|---|---|
| 11 | ශ්‍රී ලාංකික ප්‍රථම භික්ෂූන්වහන්සේ | • පරම්පරාව රැක ගැනීම |
| 12 | දියුණුවේ දොරටුවකි. | • අරිට්ඨ භික්ෂුව |
| 13 | දරුවන්ගේ යුතුකමකි. | • වෙනස්වීමයි |
| 14 | අනිත්‍යතාව ලෙස හඳුන්වන්නේ | • සම්මා වාචා |
| 15 | නිවැරදි වචනය යනු | • දැහැමිව ජීවත් වීමයි |

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන මත ලියන්න.**

(සංඝමිත්තා රහත් මෙහෙණි / කාලපාසාද පිරිවෙන / ජීවක / විරමණය / විශාඛා සිටු දියණිය)

16 මහමෙවුනාවේ ඉදිකළ මුල්ම පන්සල ......................................................................

17 සාකේත නුවර සිටු දේවියගේ හිසේ අමාරුව සුවකළ වෛද්‍යවරයා ............................................................ ය.

18 ශීලය දෙයාකාරය. ඉන් එකක් සමාදානය වන අතර අනෙක් අංගය ............................................................ යි.

19 ශ්‍රී මහා බෝධීන් වහන්සේ අපේ රටට වැඩම කරවූයේ ................................................................... වහන්සේ ය.

20 බුදු සසුනෙහි අග්‍ර දායිකාව .......................................................................................... යි.

(ලකුණු 2 x 20 = 40)

# II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 (1) පංච මහා විලෝකනය (පස්මහ බැලුම්) අතරින් 2 ක් ලියන්න.

(2) මෛත්‍රී භාවනාවේ ආනිසංස 2 ක් ලියන්න.

(3) දියුණුවේ දොරටු 2 ක් ලියන්න.

(4) වප් මඟුල් දින බෝසත් කුමරු වැඩූ භාවනාව කුමක් ද?

(5) රාහුල හිමිගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ 2 ක් ලියන්න.

(6) අප රටේ අනන්‍යතාව පෙන්නුම් කරන සංකේත දෙකක් ලියන්න.

(7) ................................................

................................................

අත්තානං උපමං කත්වා

නහනෙය්‍යන ඝාතයෙ යන ගාථාවේ මුල් පද දෙක ලියන්න.

(8) දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකම් දෙකක් ලියන්න.

(9) මිහිඳු හිමි සමඟ වැඩම කළ රහතන් වහන්සේලා දෙනමකගේ නම් ලියන්න.

(10) ලක්දිව ඉදිවූ මුල්ම චෛත්‍යය නම් කරන්න.

02 (1) සිදුහත් බෝසතාණන්ගේ ගුරුවරු දෙදෙනෙකුගේ නම් ලියන්න.

(2) නිබ්බුත පද ඇතුළත් ගාථාව ලියන්න.

(3) ඔබගේ දෙමාපියන් සැනසීම සඳහා ඔබට කළ හැකි යහපත් ක්‍රියා පහක් ලියන්න.

03 (1) පංච සීලයේ පළමු හා තෙවන සිල්පදවල තේරුම් ලියන්න.

(2) බෞද්ධ විහාරස්ථානයකට යන ඔබ පළමුව, දෙවනුව හා තෙවනුව වන්දනා කරන ස්ථාන තුන පිළිවෙලින් ලියන්න.

(3) කොවිඩ් රෝගයට ගොදුරු වී නිරෝධායනය වන ඔබ අසල්වාසියකුට පිහිට විය හැකි ආකාර 5 ක් ලියන්න.

04 (1) තංච කම්මං කතං සාධු .... යන ගාථාව සම්පූර්ණ කරන්න.

(2) එහි තේරුම ලියන්න.

(3) සතුට, සොම්නස ගෙන දෙන යහපත් ක්‍රියා පහක් ලියන්න.

05 (1) ලෝක පරිසර දිනය ලියන්න.

(2) පරිසරයෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න.

(3) බුදු රජාණන් වහන්සේ ස්වභාවික පරිසරය උපයෝගී කරගත් අවස්ථා ලැයිස්තුවක් පිළියෙල කරන්න.

06 (1) මිහිඳු මහ රහතන් වහන්සේ සමග වැඩම කළ

(a) සාමණේර භික්ෂූන් වහන්සේ

(b) උපාසක තුමා

ලියන්න.

(2) (a) ශ්‍රී ලංකාවේ පළමු භික්ෂුණීන් වහන්සේ

(b) ශ්‍රී මහා බෝධීන් වහන්සේ රැගත් නෞකාව ගොඩ බැසූ වරාය

(c) ශ්‍රී ලාංකික පළමු භික්ෂූන් වහන්සේ කවුරුන්දැයි ලියන්න.

(3) මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම වීමෙන් පසු අපට උරුම වූ දායාද පහක් ලියන්න.

07 (1) ශ්‍රද්ධාවේ ප්‍රභේද දෙක ලියන්න.

(2) දස්සන කාමෝ සීලවත්තං .......

ගාථාව සම්පූර්ණ කරන්න.

(3) පහත සඳහන් වචන සඳහා භාවිතා කරන ශාසනික වචන ලියන්න.

අත් සේදීම -

අතුගානවා -

ලැගුම් ගෙය -

තේ, කෝපි වැනි බීම -

ආහාර අනුභව කිරීම -

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) 1 (02) 2 (03) 3 (04) 4 (05) 1 (06) ✓
(07) ✓ (08) × (09) × (10) × (11) අරිට්ඨ කුමරු (12) දැහැමිව ජීවත්වීම
(13) පරම්පරාව රැකගැනීම (14) වෙනස් වීමයි (15) සම්මා වාචා
(16) කාලපාසාද පිරිවෙන (17) ජීවක (18) විරමණය (19) සංඝමිත්තා රහත් මෙහෙණිය
(20) විශාඛා සිටු දියණිය

(ල. 20 x 20 = 40)

## II - කොටස

01 (1) කාලය, දීපය, දේශය, කුලය, මව යන පිළිතුරු වලින් 2 ක්
(2) 33 පිටුවේ දැක්වෙන ආනිසංස 11 න් ඕනෑම 2 ක් ලියා තිබීම.
(3) නිරෝගී බව, සිල්වත් බව, වැඩිහිටි උපදෙස් ලැබීම, හොඳ ඉගෙනීමක් තිබීම, දැහැමිව ජීවත් වීම, කම්මැලි නොවීම මින් කරුණු 2 ක්
(4) ආනාපාන සති භාවනාව
(5) කීකරුකම, අවවාද පිළිගැනීම, ඇත්ත කථා කිරීම, අනතිමානී බව
(6) ජාතික කොඩිය, ජාතික ගීය, ජාතික පුෂ්පය, ජාතික වෘක්ෂය
(7) සබ්බේ තසන්ති දණ්ඩස්ස
සබ්බේ භායන්ති මච්චුනෝ
(8) 57 පිටුව සඳහන් දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකම් වලින් ඕනෑම 2 ක්
(9) ඉට්ඨිය රහතන් වහන්සේ / උත්තිය රහතන් වහන්සේ / සම්බල රහතන් වහන්සේ / භද්දසාල රහතන් වහන්සේ
(10) ථූපාරාම චෛත්‍යය

02 (1) භාර්ගව, ආලාරකාලාම, උද්දකරාමපුත්ත
(2) නිබ්බුතා නූන සා මාතා - නිබ්බුතා නූන සෝපිතා
නිබ්බුතා නූන සානාරී - යස්සායං ඊ දිසෝපතී
(3) යහපත් ක්‍රියා (කුසල් ක්‍රියා) 5 කට ලකුණු දෙන්න.

03 (1) මම සතුන් මැරීමෙන් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි.
මම කාමෙහි වරදවා හැසිරීමෙන් වැළකීමේ සිල්පදය සමාදන් වෙමි.
(2) චෛත්‍ය වහන්සේ, බෝධීන් වහන්සේ හා පිළිම වහන්සේ
(3) පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න.

04 (1) තංච කම්මං කතං සාධු
යං කත්වා නානු තප්පති
යස්ස පතීතො සුමනො
විපාකං පටි සේවතී
(2) යම් ක්‍රියාවක් නිසා පසුතැවිල්ල ඇති නොවේ ද එහි විපාකය සොම්නසින් විඳිය හැකිවේ ද එවැනි ක්‍රියා කිරීම හොඳයි.
(3) ලියා ඇති පිළිතුර සළකා බලා ලකුණු දෙන්න.

05 (1) ජූනි 05
(2) පිරිසිදු ජලය ලැබීම / ආහාර ලැබීම / පිරිසිදු වාතය ලැබීම / හිරු එළිය ලැබීම / ඖෂධ ලබාදීම
(3) සිදුහත් කුමරුගේ උපත සිදුවීම, බුදුවීම හා පිරිණිවන් පෑම පරිසරය මුල්කර ගැනීම / සත් සතියේ දෙවන සතියේ බුදු වූ බෝධීන් වහන්සේට කළගුණ සැළකීම / ස්වභාවික පරිසරය තුළ දහම් දෙසීම

06 (1) (a) සුමන සාමණේරයන් වහන්සේ
(b) භණ්ඩුක උපාසක තුමා
(2) (a) අනුලා දේවිය
(b) දඹකොළ පටුන
(c) අරිට්ඨ කුමරු
(3) 94 පිටුවේ දැක්වෙන දායාද ලියා ඇත්නම් ලකුණු දෙන්න.

07 (1) අමූලිකා ශ්‍රද්ධාව හා ආකාරවතී ශ්‍රද්ධාව
(2) දස්සන කාමෝ සීල වතං
සද්ධම්මං සෝතුමිච්ඡති
විනෙය්‍ය මච්ඡෙර මලං
සවේ සද්ධෝති වුච්චති
(3) අත් දෝවනය කිරීම / අමදිනවා / ආවාස ගෙය / ගිලන්පස / දානය වළඳනවා